**ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලීසිය**

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලීසියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කලට සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය රු.763,726,013 ක් වුව ද, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.684,016,443 ක් වූයෙන් රු.79,709,570 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස දීර්ඝ කාලයක සිට ඉදිරියට එන අතර දෙපාර්තමේන්තු පාලන ගිණුම හා කේවල ශේෂ අතර වෙනස ක්‍රමිකව අඩු කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවීම. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

ශ්‍රී ලංකා පොලීසිය විසින් ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් පොලිස් කොට්ඨාශ වාර්තා ඒකාබද්ධ කර වත්කම් ලේඛනයක් පිලියෙල කර පවත්වා නොතිබුණි. | පොලිස් කොට්ඨාස මට්ටමින් ඒකාබද්ධ වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වා තිබුණි. | සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 වියදම් කළමනාකරණය**

---------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 555.95 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර, වර්ෂය තුළ මුදල් රෙගුලාසි 66 මගින් රු. මිලියන 325 ක් මාරු කරගෙන තිබුණ ද, වර්ෂය අවසානයේ රු.මිලියන 880.95 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | විදේශ ණය ගෙවීම් වැය විෂයය 225-1-1-23-2101 (12) යටතේ ජීප් රථවල වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කළ ද ජීප් රථ ලබා ගැනීමේ කටයුතු දෙසැම්බර් මාසයේදී සිදුවූ නිසා 2022/12/31 දිනට පෙර ගිණුම් තැබීමේ කටයුතු සිදුකර ගත නොහැකි වූ බව දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් යුතුව ප්‍රතිපාදන ඇතිකර ගැනීමට වගබලා ගත යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | බැදීම් ප්‍රකාශය සටහන (iv) අනුව වැය විෂයය අංක 225-1-1-0-1204 වෛද්‍ය සැපයුම් කොට්ඨාශයේ (ඖෂධ මිලදී ගැනීම සඳහා) බැදීම් හා බැරකම් වටිනාකම රු.15,678,982 ක් වුව ද, එය ඉක්මවා රු.323,489,273 ක් ගෙවා තිබුණි. | බැදීම් ප්‍රකාශය සටහන (iv) අනුව බැදීම් හා බැරකම් වටිනාකම රු.15,678,982 ක් වුව ද, රාජ්‍ය ඔසුසල වෙත පවතින බැරකම් හා බැදීම්වල එකතුව රු.323,489,273 ක් වූයෙන් බැදීම් හා බැරකම්වල මුළු වටිනාකම රු.339,168,255 ක් වන බව දන්වා තිබුණි. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| | 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටස | මුදල්’ සම්බන්ධ කටයුතුවලට අදාළ “ජාතික පොලිස් අධ්‍යාපන ආයතනයේ අරමුදල පිහිටීම හා පනතේ ඊට අදාළ‘22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදු ව නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ද ප්‍රතිපාදන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ආදායම් සහ වියදම් වාර්තා කිරීම 225 - ශ්‍රී ලංකා පොලීසිය වැය ශීර්ෂය යටතේ වන බැවින් ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කාර්තව්‍යයන් සිදු කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | අරමුදල පිහිටුවීමට අදාල නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | 2009 මැයි 01 දිනැති අංක 11/2009 දරන චක්‍රලේඛයේ සංශෝධිත XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය | ගම්පහ පොලිස් කොට්ඨාශයට අයත් රජයේ නිවාස නිලධාරීන්ට ලබා දීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. | ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සඳහා නිල නිවාස ලබා දීම පිළිබඳ පොලිස්පති චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර ඉදිරියේ දී පොලිස්පති චක්‍රලේඛයක් මඟින් ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව කටයුතු කිරීම සඳහා දැනුවත් කිරීම් සිදු කිරීමට නියමිත බව දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ නව මුදල් රෙගුලාසි 876 | චක්‍රලේඛ ප්‍රකාරව පොලිස් ක්‍රීඩා අරමුදල නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පොලිස් ක්‍රීඩා සංගමය/ අරමුදල නිලධාරීන්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සංගමයක් වන බැවින් පොලිස් ක්‍රීඩා අරමුදලෙහි නාමය පොලිස් ක්‍රීඩා සංගමය ලෙස වෙනස් කිරීමට පොලිස් ක්‍රීඩා සංගමයේ අරමුදල් කළමනාකරණය කිරීම සම්බන්ධව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (වයඹ පළාත) ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී තීරණය කර ඇති බවත් ඒ අනුව 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 2.3 තැන්පත් ශේෂයන්

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ දී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු.45,837,000 ක පරිත්‍යාග මුදලින් ඉතිරිව පවතින රු.11,503,192 ක මුදලක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන පවතින අතර ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද නොවීය. | මෙම ඉතිරි මුදල සාර්ක් ත්‍රස්තවාදී සහ මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි අලුත්වැඩියා කටයුතු සඳහා යෙදවීමට ශ්‍රී ලංකා පොලීසිය විසින් යෝජනා කරමින් අංක SO/IN/OUT/SO4/417 /18 දරන 2018 ජනවාරි 29 දිනැති ලිපිය විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් කත්මණ්ඩු සාර්ක් මහ ලේකම් තුමා වෙත යොමු කර ඇත. 2018 වර්ෂයෙන් පසුව සාර්ක් සමුළුවක් පවත්වා නොමැති බැවින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ද අවස්ථාවක් ලැබී නොමැති බව දන්වා තිබුණි. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

----------------------------------

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ12.1 ඡේදය අනුව වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභා ගත කිරීම සඳහා නියමිත විධි විධාන යටතේ | අදාල මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. |

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇති බැවින් ඒ අනුව 2023.02.28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ ශ්‍රී ලංකා පොලීසියේ 2022 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන තුළ කාර්ය සාධන වාර්තාව ඇතුළත්ව නොමැති බව දන්වා තිබුණි.

**3.2 ප්‍රසම්පාදනයන්**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේදී පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරින් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට සැපයීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිය සැපයුම අවලංගු කිරීමට එරෙහිව සැපයුම්කරු බේරුම්කරණය වෙත ගොස් තිබුණි. බේරුම්කරණයේ දී 2017 ජනවාරි 21 දින ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ද ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණු අතර සැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලිසිය දැරිය යුතු බවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. 2023 ජනවාරි 25 දින වන විට රු.219,357,715 ක් ගෙවීමට සිදුවෙතැයි ශ්‍රී ලංකා පෙලීසිය විසින් ඇස්තමේන්තු | වාණිජ මහාධිකරණ තීන්දුව ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් හිස් වැසුම් 60,000 ක් සඳහා සැපයුම්කාර ආයතනය වෙත ගෙවිය යුතු ඇමරිකානු ඩොලර් 414,000 ක මුදලින් සියයට 10 ක මුදල වන ඇමරිකානු ඩොලර් 41,400 ක මුදලක් 2022 මාර්තු 16 දින විදේශීය නියෝජිත ආයතනය වෙත ගෙවා ඇති අතර ඉතිරි මුදල ගෙවීම සඳහා ණයවර ලිපි විවෘත කර ඇති බවත් 2023 ජුනි 06 දින ශ්‍රී ලංකාව වෙත භාණ්ඩ ලැබීමට නියමිත බවත් දන්වා තිබුණි. | මෙම ප්‍රසම්පාදන හා බේරුම්කරණ ක්‍රියාවලියේ අඩුපාඩු මත රජයට දැරීමට සිදුවන අමතර වියදම් සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණ ද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවිධිමත්භාවය හා දීර්ඝ කාලයක් ගත වුවද සමතකරණයකට නොපැමිණ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් දැරීමට වන පිරිවැය සඳහා වගකිවයුත්තන් හෝ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | හබරාදූව "නිල සෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 3.8 බැගින් නිවාස 192 ක් රු.මිලියන 729.6 කට මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු.මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර මෙම නිල නිවාස අවශ්‍යතාවය හා ඉල්ලුම පිළිබඳ නිවැරදි අධ්‍යනයක් සිදු නොකර මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබීම හේතුවෙන් අදාළ පොදු පහසුකම් ද ඇතුළුව නිවාස 192 ක් විධිමත් පරිදි පවරා ගැනීමේ කටයුතු ද 2023 මාර්තු මාසය වන විටත් අවසන්ව නොතිබුණි. | ඒ සඳහා නීති උපදෙස් ලබා ගැනීම සඳහා ගරු නීතිපතිතුමා වෙත දැනුම් දී ඇති නිසාත් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලැබීමෙන් අනතුරුව තක්සේරුව පිළිබඳව නිසි එකඟතාවයකට පැමිණීමෙන් පසු නිවාස 128 මිල දී ගැනීම සඳහා නව ගිවිසුමකට ඇතුළත් වෙමින් නිවාස මිල දී ගැනීමට ඉහත නිරීක්ෂණ වලට යටත්ව නෛතිකව බාධාවක් නොමැති බව අධ්‍යක්ෂ නීති කොට්ඨාශය විසින් දැනුම් දී ඇත. ඒ අනුව ගිවිසුම් ගත වූ නිවාස ඒකක 192 වෙනුවට, ලබා දී ඇති, අත්තිකාරම් මුදල ආවරණය වන පරිදි නිවාස 128 ක් පමණක් මිල දී ගැනීමට නියමිතව ඇති බව දන්වා තිබුණි. | නිවාස පවරා ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජුනි 20 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදී තිබු පොලිස් අධ්‍යයන ආයතනයක් | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුනද උක්ත ඉඩම රාජසන්තක කර නොමැති | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පිහිටුවීමට යෝජිත අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක ප්‍රමාණයකින් යුත් මල්වානේ පිහිටි ඉඩමද, පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා පොලිස් රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත අක්කර 75 ක් වූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩමද ඉංගිරියේ උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ වැඩ ආරම්භ කර රු.මිලියන 8.8 ක් වැයකර ඉදිකිරීම් අතරමඟ නවතා තිබූ අක්කර 06 ක පමණ භූමිය යන ඉඩම් නිරවුල්ව පවරා ගැනීමක් සිදුවී නොතිබුණි | හිමිකරුවකු ඉදිරිපත් නොවූ ඉඩමක් වන බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව රජය වෙත අත්කර ගත යුතු අතර ඒ සඳහා ඉඩම ඉල්ලුම්කාර දෙපාර්තමේන්තුව විසින් අදාළ අත්පත් යෝජනා සකස් කර ඉදිරිපත් කළ යුතු බව දන්වා තිබුණි.<br><br>විරෝධතා පරීක්ෂණ පවත්වා විරෝධතා කිසිවක් ඉදිරිපත්ව නොමැති බැවින් අත්කර ගැනීමේ ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් 2022.10.29 දින සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලා ඇති බව දන්වා තිබුණි.<br><br>2023.04.06 වන දින ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් ශ්‍රී ලංකා පොලිසිය සඳහා වෙන් කර ඇති මෙම ඉඩමේ අවශ්‍ය සංවර්ධන කටයුතු කිරීම සඳහා විරුද්ධත්වයක් නොමැති බවට හා ඉඩමේ අනෙකුත් මැනීම් කටයුතු සඳහා ප්‍රදේශයට අදාළ ග්‍රාම නිලධාරී සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරන ලෙසට දන්වා තිබුණි. | |
| (ආ) | 2016 දෙසැම්බර් මස එකක් රු.මිලියන 3.3 බැගින් රු.මිලියන 333 කට ගාල්ල, වැකුණගොඩ “නිල සෙවන” නිවාස ව්‍යාපෘතියෙන් මිලදී ගත් නිවාස 100 ට අදාළ පැවරුම් ඔප්පු 2023 මාර්තු මාසය වන විටත් ලබාගෙන නොතිබුණි. | මෙම නිල නිවාස 100 සඳහා පැවරුම් ඔප්පු සහ සහාධිපත්‍යය සැලසුම් ලබා දෙන ලෙස Walkers CML සමාගම වෙත දැනුම් දෙන ලදී. එම සමාගම විසින් මුද්දර ගාස්තු, නීතිඥ ගාස්තු හා සහාධිපත්‍යය සැලසුම් ගාස්තු ගෙවන ලෙස දන්වා තිබුණු අතර අදාළ මුදල් ගෙවීම් කිරීමට බාධාවක් නොමැති බවට ගරු නීතිපතිතුමා විසින් 2023.03.03 දින දන්වා ඇති | නිවාස පවරා ගැනීම සඳහා ඔප්පු ලබා ගැනීම කඩිනමින් කළ යුතු වීම. |

අතර ඒ අනුව පැවරුම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.

## 3.4 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශයට අයත් නාරාහේන්පිට පොලිස් රෝහලේ ගබඩාවල පැවති 2018 -2022 කාලපරිච්ඡේදය තුළ කල් ඉකුත් වූ ඖෂධ හා ශල්‍ය උපකරණවල වටිනාකම රු.6,896,457 ක් වූ අතර නිවැරදි තොග පාලන ක්‍රමයක් හා යාවත්කාලීන වූ ගබඩා තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක නොවීම නිසා මෙම කල් ඉකුත්වීම් සිදුව තිබුණි. | 2020, 2021 සහ 2022 වර්ෂවල පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සියළුම විශේෂඥ සායන සහා බාහිර රෝගී අංශ වෙත ප්‍රතිකාර සඳහා රෝගීන්ගේ පැමිණීම අවම වීම හේතු වී ඇත. පොලිස් තොරතුරු තාක්ෂණ කොට්ඨාසය හා රෝහලේ පරිගණක අංශය එක්ව පරිගණක වැඩසටහන සකස් කිරීමෙන් පසුව පොලිස් රෝහල්වල ඖෂධ සම්බන්ධයෙන් නිවැරදි තොග පාලන ක්‍රමයක් පවත්වා ගැනීමට හැකි වන බව දන්වා තිබුණි. | නිවැරදි තොග පාලන ක්‍රමයක් හා යාවත්කාලීන වූ ගබඩා තොරතුරු පද්ධතියක් ක්‍රියාමත්මක කළ යුතු වීම. |
| (ආ) | අලාභ හානි අවස්ථා 42 කට අදාළ රු.33,092,970 ක් වාර්තා වී 2023 මැයි මාසය වන විට වසර 05 ක් ඉක්මවා පැවතියද මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් නීතිපතිතුමා වෙත අවශ්‍ය ගොනු යොමු කර ඇති අතර නීතිපතිතුමා වෙතින් අනුමැතිය ලැබුණු පසු අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණි. | අදාල අංශ සමඟ සාකච්ඡා කර ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වාහන දෙකකට අදාළව 2016 වර්ෂයේ සිදුව තිබූ අනතුරක අලාභය වූ රු.9,780,583 ක වටිනාකමින් රු.4,818,554 ක් රක්ෂණ වන්දි ලෙස අයවී පැවති බැවින් ඉතිරි අලාභයේ වටිනාකම රු.4,962,029 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම(i) පාඩු හා අත්හැරීම පිළිබඳ | 2016 වර්ෂයේදී කුරුඳුවත්ත ප්‍රදේශයේ දී සිදුව තිබූ රු.4,962,029 ක් වූ අනතුරක අලාභය, රු.7,190,583 ක් ලෙස වැරදීමකින් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති අතර එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ පාඩු හා හානි යටතේ නිවැරදි වටිනාකම ඇතුළත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනයේ අයවිය යුතු අලාභයේ වටිනාකම ලෙස රු.7,190,583 ක් දක්වා තිබුණි. | | |
| (ඇ) | 2005, 2006 යන වර්ෂවල අම්පාර පොලිස් ස්ථානයේ සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරනය වූ රු.6,297,306 ක භාණ්ඩ ඌනතාවය මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (i) හි පාඩු හා අත්හැරීම පිළිබඳ ප්‍රකාශනයේ රු.2,725,203 ක් ලෙස දක්වා තිබුණි. | 2005, 2006 යන වර්ෂවලද අම්පාර පොලිස් ස්ථානයේ සිදු කළ භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වූ රු.6,297,306 ක භාණ්ඩ ඌනතාවයට අදාළව රු.4,831,359 ක මුදලක් 2023 මාර්තු 20 දින පොතෙන් කපා හැරීමට අනුමැතිය ලබා දී තිබූ අතර, එය වැරදීමකින් 2022 මූල්‍ය ප්‍රකාශනයේ රු.2,725,203 ක් ලෙස දක්වා තිබුණි. මෙම දෝෂය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ පාඩු හා හානි යටතේ නිවැරදි වටිනාකම ඇතුළත් කළ යුතු වීම. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

---------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලුතින් ආරම්භ කිරීමට යෝජිතව පැවති මාබෝදල හා රංවල පොලිස් ස්ථාන සඳහා ගොඩනැගිලි දෙකක් කුලියට ලබාගැනීම සඳහා සැලසුම්කර තිබුණද, බදු ගිවිසුමකට එළඹ නොතිබියදී හා ඒ සඳහා දේපළ කළමනාකරණ කොට්ඨාශයේ නිසි අනුමැතියකින් තොරව ගොඩනැගිලි දෙකක් ලබාගෙන තිබූ අතර එම ගොඩනැගිලි දෙකෙහි වැසිකිලිවලට අදාළ ඉදිකිරීම් කිරිම, තීන්ත ආලේප කිරීම හා ගරාජයක් ඉදිකිරීම වැනි කටයුතු සඳහා රු.900,144 ක් ගම්පහ පොලිස් කොට්ඨාශය මගින් වැයකර තිබුණි. පොලිස් | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුගතව, මාබෝදල හා රංවල පොලිස් ස්ථාන ආරම්භ කිරීමට නොහැකිවී ඇති අතර කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සම්බන්ධයෙන් බදු ගිවිසුම්වලට එළඹීම සඳහා මාබෝදල පොලිස් ස්ථානය 2022.01.31 දින ද රංවල පොලිස් ස්ථානය සඳහා 2021.07.28 දින ද අධ්‍යක්ෂ, දේපළ කළමනාකරණ වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති බව දන්වා තිබුණි. | බදු ගිවිසුම් වලට එළඹීමට පෙර ගොඩනැගිලි සඳහා වියදම් දැරීම නොකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාන අලුතින් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය නතර කර ඇති බැවින් මෙම වියදම අනාර්ථික වියදමක් විය. | | |
| (ආ) | ත්‍රස්ත මර්ධන හා විමර්ශණ කොට්ඨාශය හා අලුතින් පිහිටුවන ලද පොලිස් කොට්ඨාස 04 ක් පවත්වාගෙන යාම සඳහා 2020 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා මසකට රු.9,775,000 බැගින් රු.234,600,000 කට (VAT රහිත) කොළඹ 05 කිරුලපන ඇවනියුහි භූටානි කැපිටල් ගොඩනැගිල්ල කුලියට ලබාගෙන තිබුණු අතර 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වසර 02 ක් සඳහා ද මෙම ගොඩනැගිල්ල මසකට රු.10,400,000 බැගින් එකතුව රු.249,600,000 කට නැවත කුලියට ලබාගෙන තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා බාහිර රථ ගාලක් නොමැති අතර මහල් 06 ක් වැනි සැලකිය යුතු ඉඩකඩක් රථ ගාල සඳහා නිර්මාණය කර ඇත. එහි මෝටර් රථ හැර යතුරුපැදි, ත්‍රීරෝද රථ වැනි වාහන නවතා තැබීමට නොහැකි අතර එහි මෝටර් රථ ඉහළ, පහළ ගෙන යාම සඳහා අධික විදුලි පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. 2023 මාර්තු මාසය වන විට රු.3,000,000 ක් ඉක්ම වූ මාසික විදුලි පිරිවැයක් මෙම ගොඩනැගිල්ල සඳහා වැය කිරීමට සිදු වී තිබුණි. | පොලිස් මූලස්ථානයේ නව මහලේකම් ගොඩනැගිල්ලේ සිදු කරගෙන යනු ලබන අළුත්වැඩියාවන් තවදුරටත් සිදුවෙමින් පවතින බැවින් 2023 දෙසැම්බර් 31 දක්වා කුලියට ලබා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගනිමින් වාහන ගාල් කිරීම සඳහා විදුලි පිරිවැයක් දැරීමට සිදු වන අතර මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට අදාළ විදුලි වියදම් ශ්‍රී ලංකා පොලීසිය ගෙවීම් කල යුතු බවට 2022 දෙසැම්බර් 30 දින අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර ඇති බව දන්වා තිබුණි. | ගොඩනැගිලි කුලියටගැනීමේදී අවශ්‍යතාවය හා නඩත්තු වියදම් පිළිබඳ අවධානය යොමුකිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.6 කලමනාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම අවි ගබඩාව, කැරලි මර්ධන ඒකක, පොලිස් විද්‍යාල, කොට්ඨාස හා පොලිස් ස්ථානය යටතේ පවතින අවි ගබඩාවල ලැබීම්, නිකුත් කිරීම්, ආපසු භාරගැනීම් හා තොග මට්ටම් යනාදිය ක්ෂණිකව හඳුනාගත හැකි තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මකව නොපැවතුණි. | පොලිස්පතිතුමාගේ නියෝග අනුව එම පද්ධතිය අන්තර්ජාලය හා VPN තාක්ෂණයට අනුව වැඩි දියුණු කළ පද්ධතියක් මේ දින වල සකස් කරමින් පවතින අතර නොබෝ දිනකින් එහි වැඩකටයුතු අවසන් කිරීමට නියමිතව ඇති බව දන්වා තිබුණි. | මධ්‍යම අවිගබඩාව සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් කඩිනමින් හඳුන්වා දියයුතු වීම. |
| (ආ) | මධ්‍යම අවි ගබඩාව තුළ භාවිතයට ගත නොහැකි අවි, පතරොම්, කැරලි මර්ධන උපකරණ හා සංග්‍රාමික උපකරණ විශාල ප්‍රමාණයක් විනාශ කරනතෙක් කන්ටේනර් පෙට්ටි 09 ක අවිධිමත් හා ගණනය කළ නොහැකි ලෙස ගොඩ ගසා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අපහරණයට නියමිත භාණ්ඩ විධිමත් හා ගණනය කළ හැකි අයුරින් ගබඩා කළ යුතු වීම. |
| (ඇ) | මධ්‍යම අවි ගබඩාවේ බඩු වට්ටෝරු ලේඛනයට අනුව භාවිත කිරීමට නොහැකි C S Tear Gas (shells) උණ්ඩ 4,844 ක් හා C S Tear Gas (Grenades) 4,992 ක් තිබිය යුතු වුව ද, ගබඩාවේ පැවති 1,056 (893 ක් හා 163 ක්) ක ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණය පිළිබඳ ලේඛනගත තොරතුරු අසම්පූර්ණ ඒවා විය. කෙසෙල්වත්ත හා නාරාහේන්පිට පොලිස් ස්ථාන දෙකෙහි පැවති Tear Gas 871 ක ප්‍රමාණය 2004, 2005 හා 2012 වර්ෂවල නිෂ්පාදිත ඒවා විය. මේ අනුව කල් ඉකුත් වූ Tear Gas තොග පොලිස් ස්ථාන සතුව පැවති අතර ඒවා නිකුත් කිරීමේ ඉඩකඩක් ද පැවතුණි. | නිලධාරීන් පරීක්ෂාවට ලක්කරන අවස්ථාවේදී කන්ටේනර් පෙට්ටිවලට දැමීමමට සුදානම් කර ගබඩාවේ කොරිඩෝවේ තිබූ කඳුළුවායු පතරොම් 890 ක ප්‍රමාණයක් භෞතිකව පරීක්ෂා කළ අතර ඉතිරි පතරොම් 3951 ක ප්‍රමණය කන්ටේනර් පෙට්ටිවලට දමා තිබුණු අතර භාවිතයට ගත නොහැකි කඳුළු වායු පතරොම් 20199 ක් ද, කඳුළු වායු බෝම්බ 13084 ක් ද, මුළු 33283 ප්‍රමාණය පොලිස්පතිතුමාගේ නියෝග මත 2023 ජූලි 01 වන දින අරන්තලාව විශේෂ කාර්ය බලකා කඳවුරේදී මෙම භාවිතයට ගත නොහැකි | කල් ඉකුත් වූ Tear Gas අපහරණය සඳහා කඩිනමින් කටයුතු කළයුතු අතර ලේඛනගත තොරතුරු නිවැරදිව හා යාවත්කාලීනව පවත්වාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | පතරොම්, කැරළි මර්ධන උපකරණ, සංග්‍රාමික උපකරණ හා කඳුළු වායු පතරොම්, බෝම්බ ව්‍යපහරණය කිරීම නියමිතව ඇති බව දන්වා තිබුණි. | |
| (ඇ) | රථ වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ අවසන් වරට මිලදී ගෙන තිබුණේ 2016 වර්ෂයේ දී වූ අතර මිලදී ගත් ප්‍රමාණය 25 ක් පමණක් විය. ඊට පෙර 2014 වර්ෂයේ දී 30 ක් ද, 2010 දී 100 ක් ද, මිලදී ගෙන තිබුණි. මෙම උපකරණ අතරින් විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. 2018 - 2022 කාල පරිච්ඡේදයේ වාර්ෂිකව වේග මාපක යන්ත්‍ර (Automatic Speed Trap) 500 බැගින් රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශය විසින් ඉල්ලුම් කර තිබුණද ඒවා ලැබී නොතිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් වේග මාපක යන්ත්‍ර මිල දී ගැනීම සඳහා රු.මි.150 ක් වෙන් කර ඇති බව දන්වා තිබුණි. | රථ වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ නව උපකරණ කඩිනමින් රථවාහන රාජකාරී සඳහා ලබා දිය යුතු වීම. |
| (ඉ) | ශ්‍රී ලංකා පොලීසිය මඟින් අධිකරණ වෙත යොමු කෙරෙන අපරාධ හෝ වැරදිවලට අදාළව තවදුරටත් පවත්වාගෙන යන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු, තීන්දු ලබාදුන් නඩු පිළිබඳ විස්තර, බහා තැබීම් හෝ නිශ්ප්‍රභාවීම් වූ නඩු යන විස්තර ඇතුළත් යාවත්කාලීන තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය කැපී පෙනෙන අතර ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය පිළිබඳව සමාලෝචනයේ දී එවැනි පද්ධතියක අවශ්‍යතාවය වැදගත්වන නමුත් එවැනි පද්ධතියක් පවතින බව සනාථ නොවීය. | ශ්‍රී ලංකා පොලීසිය විසින් භාවිතා කරනු ලබන දත්ත පද්ධතීන් අතරින් අපරාධ විමර්ශනය සහ පරිපාලනය සඳහා ප්‍රධාන වශයෙන් පරිගණක වැඩසටහන් 20 ක් පවතින අතර ඉන් 14 ක් අපරාධ විමර්ශනය සඳහා දායක වන බවට හඳුනා ගෙන ඇත. අපරාධ විමර්ශන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ අධිකරණ කටයුතු විධිමත් කිරීමට ඉහත සඳහන් පද්ධති මඟින් විශාල පිටිවහලක් ලබා දෙන බව මේ වන විට මෙම පද්ධතිවල තිබෙන තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය වූ බව දන්වා තිබුණි. | අධිකරණයේ විභාගවන නඩු සම්බන්ධයෙන් පොලීසියේ කාර්ය සාධනය මැනිය හැකි ලෙස දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අම්පාර පොලිස් ස්ථානයේ දිසා ගබඩාවේ අබලි භාණ්ඩ ගබඩාකර තිබූ තාවකාලික මඩුව ගින්නෙන් විනාශ වී 2013 වර්ෂයේදී රු.2,760,885 ක අලාභයක් සිදුවී තිබුණි. මෙම අලාභය මුදල් රෙගුලාසි 109 යටතේ කපා හැරීමට නිර්දේශකර තිබුණ ද, පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන තුළ තවදුරටත් පැවතුණි. | පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබීම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පොතෙන් කපා හැරීමේ නියෝග විධිමත් ලෙස සටහන් කර පාඩු හා හානි වටිනාකම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (උ) | 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. සංශෝධන සිදුකළ යුතු ක්ෂේත්‍ර 16 ක් ද හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද 2023 මැයි මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි. | මේ වන විට පොලිස් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් යුක්තව කමිටු 03 ක් ස්ථාපිත කර ඇත. කමිටු 03 හි නිරීක්ෂණ ලද පසව එය ද නීතිපතිතුමා වෙත යොමු කිරීමට නියමිතව ඇති බව දන්වා තිබුණි. | පනත සංශෝධනය කළ යුතු වීම. |
| (ඌ) | දඩමුදල් අයකර ගැනීම වේගවත් කිරීමත් රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත් මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථ වාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් (Spot Fine Information System) ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතියද මේ දක්වා අදාළ ක්‍රමය ස්ථාපිතව නොතිබුණි. | කැබිනට් අනුමැතිය ලද පසු මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු සිදු කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | හඳුනාගත් අරමුණු ඉටුවන ආකාරයට ස්වයංක්‍රීය දඩමුදල් ගෙවීම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මඟින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක වන නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | කැබිනට් අනුමැතිය ලද පසු මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු සිදු කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට හා නියමිත දඩමුදල් අයකිරීම සිදුකළ යුතු වීම. |
| (ඒ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ දී නිලධාරීන් 2,720 ක ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.63,242,416 ක් වූ අතර වර්ෂ 05 ට වැඩි හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.44,875,995 ක් වූයෙන් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දිනට වර්ෂ 05 කට වඩා වැඩි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි හිඟ හිටි ණය ශේෂය වන රු.44,875,996 ක මුදලින් 2023 මාර්තු 31 දිනට රු.1,278,668 ක් අය කර ගෙන ඇති අතර තව දුරටත් 2022.03.31 දින වන විට අය කළ යුතුව ඇති හිඟ හිටි ණය ශේෂය රු.43,597,328 ක් බව දන්වා තිබුණි. | අය විය යුතු හිඟ හිටි ණය ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවති අතර, ශ්‍රී ලංකා පොලීසිය තිරසර සංවර්ධනය අරමුණු 04 ක් යටතේ ඉලක්ක 08 ක් හඳුන්වාගෙන | ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව සමඟ සම්බන්ධ වෙමින් අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන සංදිස්ථානයන් හඳුනා ගැනීමට කටයුතු | වාර්ෂිකව ළඟාවිය හැකි ඉලක්ක හඳුනාගෙන ඒවා ඇගයීමට කටයුතු කළ යුතු වීම. |

තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතිය ද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ දී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි. කරමින් පවතින බව දන්වා තිබුණි.

## 05. මානව සම්පත් කළමනාකරණය කිරීම

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිගු කාලයක සිට නිලධාරීන්ට උසස්වීම් නොලැබීමේ ගැටළුවට විසඳුම් ලෙස පොලීසියේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා 2019 ජනවාරි 01, 2019 ජූලි 01, 2020 ජනවාරි 01 හා 2020 පෙබරවාරි 08 යන දිනවල එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසලකා දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබාදීම නිසා නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 16,953 ක් වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදීම අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පොලිස් නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුර දක්වා වූ කාන්තා හා පිරිමි පොලිස් නිලධාරීන්ට සිදුව තිබූ අසාධාරණය ඉවත් කිරීමට 2019, 2020 කාල පරිච්ඡේදයේ අවස්ථා 04 කදී පැවති පුරප්පාඩු සංඛ්‍යාව නොසලකා උසස්වීම් ලබා දී තිබුණි. ඒ අනුව නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ 2019.01.01 දින 6,055 ක්ද, 2019.07.01 දින 3,800 ක්ද, 2020.01.01 දින 16,983 ක් හා 2020.02.08 දින 7,413 ක්ද වශයෙන් එකතුව 34,251 කට දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දී තිබුණි. මේ අනුව මෙම ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක නොකර අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුව | විධායක සේවා ගණයේ තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2019.07.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කර ඇති අතර, නියාමන සේවා ගණයේ තනතුරුවලට අදාළව නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටීන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2020.10.23 දිනැති NPC/ED/NGO/06/SOR/ 07/2020 (Vol- i, ii, iii ) යටතේ අනුමත කර ඇත. අධිකරණයේ නඩු | නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේදී අනුමත උසස්වීමේ පටිපාටි අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වී නොතිබුණි. | කිහිපයක් පැවතීම හේතුවෙන් එම උසස්වීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර, අධිකරණයේ විභාග වූ එම නඩු මේ වන විට අවසන් වී ඇත. එබැවින් අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටීන් අනුව උසස්වීම් ලබා දීම ඉදිරියේ දී සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | |
| (ඇ) | සහායක සේවයට අයත් විවිධ තනතුරු නාම 110 ක් අනුමතව පැවති අතර එයින් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුමතව පැවතියේ තනතුරු නාම 34 කට අදාළව පමණි. බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි මේ දක්වා අනුමත කර නොගත් තනතුරු නාම 76 ක් අතර වෛද්‍ය නිලධාරී - 76 ක්, පශු වෛද්‍ය - 03 ක්, කාර්මික නිලධාරී - 36 ක්, සැලසුම් ශිල්පී - 09 ක්, පරිගණක ක්‍රියාකරු 554 ක්, පරිගණක කාර්මික 25 ක්, හා කාර්මික 329 ක් වශයෙන් වෛද්‍ය, ගොඩනැගිලි, ප්‍රවාහන, අශ්වාරෝහක හා තොරතුරු තාක්ෂණ යනාදී ක්‍රියාකාරී පොලිස් කොට්ඨාශයන්ට අයත් අත්‍යවශ්‍ය තනතුරු ඒ අතර විය. | පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශයේ තනතුරු සඳහා මෙතෙක් පටිපාටි අනුමත වී නොමැති අතර, පටිපාටි අනුමත වන තෙක් ද්විතීයනය කිරීමේ පදනම මත උපසේවා සහකාර පොලිස් අධිකාරී (වෛද්‍ය) තනතුරට බඳවා ගැනීම් සිදුකර ඇති බවත් ඊට අමතරව සහකාර පොලිස් අධිකාරී වෛද්‍ය තනතුරේ පටිපාටි අනුමත වන තෙක් සහයක සේවා උප පොලිස් පරීක්ෂක තනතුරෙන් වෛද්‍ය ශිෂ්‍යයන් 29 දෙනෙකු බඳවා ගෙන දැනට කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පුහුණුව ලබන බැවින් ගොඩනැඟිලි කොට්ඨාශයට හා තොරතුරු තාක්ෂණ කොට්ඨාශයට අදාළව සහයක සේවා පටිපාටි අනුමත වි ඇති අතර එම පටිපාටි නැවත සංශෝධනයකට ලක් කළ යුතු බැවින් එම බඳවා ගැනීම් සිදුකර | සහායක සේවයේ තනතුරු නාම 76 සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස්කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | නොමැති බවත් දන්වා තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2022.12.19 දින අලුතින් පශු වෛද්‍ය තනතුරු 02 ක් අනුමත කරවා ගෙන ඇති බව ද දන්වා තිබුණි. | |
| (ඇ) | පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාශය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය. මෙම තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි. | පොලිස් ස්ථාන, කොට්ඨාස හා කාර්යාල මට්ටමින් සිටිය යුතු එක් එක් නිලයෙහි නිලධාරීන් සංඛ්‍යාව තීරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයෙක්ගේ සභාපතිත්වයෙන් යුක්ත කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව දන්වා ඇත. | පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථාන සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හඳුන්වා දීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ගම්පහ පොලිස් කොට්ඨාශයේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 50 ක් අවුරුදු 10 සිට 24 දක්වා කාල පරාසයක් තුළ එකම ස්ථානයේ සේවයේ යෙදී සිටින අතර සිවිල් කාර්ය මණ්ඩලයේ 10 ක් අවුරුදු 10 සිට 17 දක්වා කාල පරාසයක් තුළ එකම ස්ථානයේ සේවයේ යෙදී සිටී. | මාරුවීම් ප්‍රතිපත්ති අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | අනුමත මාරුවීම් ප්‍රතිපත්තිය අනුව නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදුකළ යුතු වීම. |